අද තියෙන්නෙ සංවර්ධනයක් නෙවෙයි සංවර්ධන සංදර්ශනයක්

දයා ගමගේ

එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායක නැගෙනහිර පළාත් සභාවේ විපක්ෂ නායක

සාකච්ඡා කළේ
ලාල් ඉලේපෙරුම

පසුගිය දා ඕස්ට්‍රේලියාවේ සංචාරයක යෙදුණ එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායක හා නැගෙනහිර පළාත් සභාවේ විපක්ෂ නායක දයා ගමගේ මහනා සමග වත්මන් දේශපාලන තත්වය පිළිබඳව සන්නස කළ සාකච්ඡාවකි.

ඔබ ශ්‍රී ලංකාවේ ප්‍රකට ව්‍යාපාරිකයෙක් හා ප්‍රවීණ දේශපාලකයකු වශයෙන් ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික හා දේශපාලනමය තත්වය දකින්නේ කෙසේ ද?

ක්‍රම ක්‍රමයෙන් රට ප්‍රජාතන්ත්‍රවාදයෙකත් බැහැරව වේගවත් ආඥාදායකත්වයක් කරා ගමන් කරමින් තිබෙන බව පැවසිය හැකියි. නිදහස ලැබීමෙන් පසු මෙතරම් සුවිශාල ආර්ථික පරිහානියකට ලක් වූ කාල වකවානුවක් ඉතිහාසයෙන් සොයා ගත නොහැකි ය. 2009 දී වසර 30 ක යුද්ධය නිමාවෙන් පසු ආර්ථිකය දියුණු කිරීමට ලැබුණ අනගි අවස්ථාව වත්මන් රජය ප්‍රයෝජනයට නොගැනීම ඊට ප්‍රධානම හේතුවයි. ආර්ථිකය දියුණු කිරීමට නම් ප්‍රධාන වශයෙන් රටේ නිෂ්පාදනය කාර්යක්ෂමතාව වැඩි කරමින් රජය හා පෞද්ගලික අංශ වල දියුණුවක් ඇති කළ යුතුය.

විදේශ ආයෝජකයන් රටට ගෙන්වා ගැනීමට ඉතා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයි. හමුත් අද රටේ පවතින අසීමිත දූෂණය හා අවනීතිය ආයෝජකයන් ගෙන්වා ගැනීමට ප්‍රධාන බාධාවක් වී තිබෙනවා. ඒ වගේම රාජ්‍ය බලය යොදා ගිනිමින් කරන දේශපාලන පලිගැනීම් ආර්ථිකය කඩා වැටීමට තවත් ප්‍රධාන හේතුවක්. ඊට නිදසුනක් වශයෙන් පසුගිය වසරේදී ව්‍යාපාර 38ක් රජයට පවරා ගැනීම පෙන්වා දෙන්න පුලුවන්. මගේ සෙවණගල ව්‍යාපාරයත් ඔවුන් රජයට පවරා ගත්තා. ලාභ උපදවමින් දහස් ගණනකට රැකියා අවස්ථා ලබා දී රටේ ආර්ථිකයට සුවිශාල මෙහෙවරක් කළ ඒ ව්‍යාපාරය අද වෙනකොට පරිහානිය කරා ගමන් කර තියෙන බව දැකගන්න පුලුවන්. රජයට 2/3 ක බලයක් ජනතාව ලබා නොදුන්නත් මන්ත්‍රීවරුන්ට නොයෙකුත් වරදාන තර්ජන හා බලපෑම් මගින් 2/3 ක බලයක් ලබා ගනිමින් පාර්ලිමේන්තුව තුළ සම්මත කරගන්නො මෙවැනි පනත් රටට ආයෝජකයන් ගෙන්වා ගැනීම බාධාවක්.

ඒ විතරක් නෙවෙයි. බිලියන 1300 කින් රටේ ණය බර වසරකට වැඩිවෙමින් පවතිනවා. එතිසා ම තව තවත් අලුතින් ණය ලබා ගැනීමට බාධා ඇතිවී තිබෙනවා. ලබන වසර වන විට රාජ්‍ය ණය වල වාර්ෂික පොලිය ගෙවීමට රාජ්‍ය ආදායම මදි වන බව සඳහන් කළ යුතුයි. ඊට මේ රජය දී තිබෙන විසඳුම නම් ජනතාවගේ බදු බර වැඩි කරමින් බදු මිල ඉහළ දමමින් ජනතාව පීඩනයට පත් කිරීමයි. විදේශ විනිමය හිඟවීම නිසාවෙන් අපේ රුපියලේ අගය බාල්දුවී බදු මිල අහස උසට නගිමින් උද්ධමනය ඉහළ යාම රටේ ආර්ථිකයට සිදුව ඇති පරිහානිය දැක ගැනීමට තිබෙන හොඳම කැඩපතක් සේ සඳහන් කරන්න පුලුවන්.

ශ්‍රී ලංකා රජය හිතරම විදේශ ආයෝජකයන්ටත් විදේශගත ශ්‍රී ලාංකික ඩයස්පෝරාවටත් රටේ ආයෝජනය කරන ලෙස ඉල්ලීම් කරනවා. එමෙන්ම ඉන්දියාව හා චීනය මේ වන විට මහා පරිමානයේ ආයෝජනයන් ශ්‍රී ලංකාවේ ආරම්භ කර තිබෙනවා. ව්‍යාපාරිකයෙක් වශයෙන් ඔබ මේ ගැන දරන්නේ කුමන අදහසක්ද?

ප්‍රධාන වශයෙන් එදා විදේශගත වූ ද්‍රවිඩ ඩයස්පෝරාවේ මුදල් එල්ටීටීඊ ය බලහත්කාරයෙන් ලබා ගත්තා. බිලියන ගණනක් වූ එම මුදල් පාලනය කරන ලද්දේ කේ පී විසින්. අද කේපී රජයේ නැත්නම් ජනාධිපතිතුමාගේ තුරුලේ සිටින පුද්ගලයෙක්. ඒ අතින් බැලුවොත් කේපී ළඟ තිබූ එල්ටීටීඊ මුදල් වලින් කොටසක් රටේ ආයෝජනය වී තිබෙනවා. ඒ නිසා තමයි පසුගිය දිනවල අපේ කොටස් වෙළඳපොල නොයෙක් අයුරින් උත්තේජනය වනු දකින්නට ලැබුණේ. මම හිතන විදිහට ඒ මුදල් වල භාරකරුවන් වන්නේ රාජපක්ෂ පවුලයි. මොනයම් හේතුවක් නිසාවත් යුද්ධය මෙහෙයවූ සරත් ෆොන්සේකා හිටේ දමා කේ පී වැනි එල්ටීටීඊ නායකයකු නිදහසේ හැඹීමට වෙනත් හේතුවක් ඇතැයි මා හිතන්නේ නැහැ. දේශීය ව්‍යාපාරිකයන්ට ආරක්ෂාව නොමැති රටක විදෙශිකයකු හෝ විදේශගත ඩයස්පොරාවේ ආයෝජන රට තුළ කරන ලෙස පෙළඹීමක් කළනොහැකියි.

චීනය ඉන්දියාව වැනි රටවල විශාල ආයෝජන රට තුළ කරනු ලැබුවත් ඉන් අප රටේ ශ්‍රම බලකායට රැකියා අවස්ථා හෝ රටට ප්‍රතිලාභ හෝ නොලැබෙයි. ශ්‍රී ලංකාවට ලැබෙන ණයක් වශයෙන් කෙරෙන මෙවැනි ආයෝජන වලින් රට තව තවත් ණය බරින් මිරිකෙන අතර හම්බන්තොට වරාය නොරොච්චෝලේ වැනි සුදු අලින්ගෙන් සෙතක් නොවන බව කිව යුතුයි.

**මේවන විට රට තුළ විශාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. අධිවේගී මහාමාර්ග ගුවන් තොටුපොල තාප බලාගාර හම්බන්තොට වරාය වැනි දේ. මේවා අපේ ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාවෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදයත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීනුත් (පරමාධිපත්‍යය) ආරක්ෂා කිරීමට පැහැදිලිව සකස් කර තිබෙනවා. ඒ වගේම අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමටත් බැඳී සිටිනවා. හමුත් අද විධායකය විසින් ව්‍යවස්ථාදායකය සම්පූර්ණ බලය අතට ගෙන තිබෙනවා. මා කලින් කිව්වා වගේ විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන්ව නොයෙකුත් වරදාන වලින් රජයේ පැත්තට හරවාගෙන තිබෙනවා. අද ව්‍යවස්ථාදායකය විධායකයට අවශ්‍ය විදියට කටයුතු කරන තත්වයට පත් කරලා තියෙනවා. ඊළඟට අධිකරණය යටත් කරගැනීමේ ව්‍යාමයක යෙදී සිටිනවා. පසුගිය දිනවල අධිකරණයටත් බලපෑම් එල්ල වීම් වැඩිවෙමින් තිබෙන බවත් අපට පෙනී යනවා. මේ වන විට විනිශ්චයකාරවරුන් තමන්ට අවශ්‍ය තීන්දුව නොදුන්නොත් ඔවුන්ට තර්ජන හා බලපෑම් කරන තත්වයක් රටේ ඇති කර තිබෙනවා. ඊට හොඳම උදාහරණය තමයි පුත්තලමේ උසාවියේ සිද්ධිය. විශේෂයෙන් අධිකරණ සේවා කොමිෂමේ ලේකම් මංජුල තිලකරත්න විනිශ්චයකාරවරයාට මහ දවල් පහර දුන් අවස්ථාව. මේ වන තුරු ඒ පිළිබඳව වගකිව යුත්තන් අත් අඩංගුවට ගැනීමට පොලිසිය කටයුතු කර නෑ. එයත් හරියට අර කටුගෙයි රාජසිංහ රජ්ජුරුවන්ගේ කඩුවට වෙච්ච දේ වගේ උසාවියට කුඩු කාරයෙක් ඉදිරිපත් කිරීමෙන් එය යට ගසන්න කටයුතු යෙදෙයි. ඒ වගේම මේ වන විට රෙටේ තුන්වන ප්‍රරවැසියා වන අලුවිහිල්වයකාරවරියට විරුද්ධව දෝෂාභියෝගයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එයින් පෙනෙන්නේ විධායකය විසින් අධිකරණය මේවුදු කිරීමට ව්‍යවස්ථාදායකය පාවිච්චි කරන තත්වයට අද රට පත්ව තිබෙනවා.

අධ්‍යාපනය ගත්තත් ඒ වගේම තෙල් ආර්ථිදය අධිකරණය මේවා අද අවුල් ජාලා බවට පත්ව තිබෙනවා. නමුත් මේ අවස්ථාවේ ප්‍රධාන විරුද්ධ පක්ෂය වශයෙන් එක්සත් ජාතික පක්ෂය මන්ගාම්ම කටයුතු කරන බව තමයි පෙනෙන්නෙ. ඒ ගැන ප්‍රධාන විරුද්ධ පක්ෂයේ ජාතික සංවිධායක වශයෙන් ඔබේ අදහස මොකක්ද?

එක්සත් ජාතික පක්ෂය ලංකාවේ විභාලතම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයයි. එම නිසා අපේ පක්ෂයටත් අපේ නායක තුමාටත් විශාල වගකීමක් තිබෙනවා රටේ ජනතාවත් රටත් මේ ප්‍රපාතයෙන් ගොඩ ගැනීමටත්. ඒ සඳහා පක්ෂය බලයට ගෙන ඒමටත්. ඒ වගේම රටේ ජනතාවටත් වගකීමක් තිබෙනවා මන්ද ජනතාව තමයි ආණ්ඩු පත්කිරීමේ සහ නෙරැපීමේ බලය දරන්නේ. ඒ ජන්දයයි. ජනතාව ජන්දය පාවිච්චි කරන විට කල්පනා කළ යුතුයි ප්‍රථමයෙන්ම රට ගැන එසේත් නැතිනම් ගමේ කමටවත් චණ්ඩිකමටවත් යාලු කමටවත් නෙමෙයි ජන්දය පාවිච්චි කළ යුත්තේ. එවැනි පුද්ගලයින් පාර්ලිමේන්තුවට යැවීමෙන් රටටත් ජනතාවටත් සෙතක් සිදුවන්නේ නැහැ. එබැවින් ජන්දය පාවිච්චි කරනකොට බුද්ධිමත්ව රටට වැඩ කළ හැකි පිරිසක් පත් කළ යුතුයි. ඒ වගේම අපේ පක්ෂය ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් බැවින් අප ප්‍රජාතන්ත්‍රවාදීව ආණ්ඩුව කරන ජනතා විරෝධී ක්‍රියා වලට විරෝධය ප්‍රකාශ කරන අතර ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරයද අපි දිගටම කරගෙන යනවා. ඒ වගේම ආණ්ඩු විරෝධී පක්ෂ එක පොදු වේදිකාවකට ගෙන ඒමටත් කැප වී සිටිනවා.

මැතිවරණ රාශියක් එකදිගට පරාජය වී ඇති පක්ෂයක ජාතික සංවිධායක ලෙස එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවීමට ඔබ ගෙන යන වැඩ පිළිවෙල පැහැදිලි කරන්න.

පසුගිය මැතිවරණ පිටුපස ඔබ නොදකින බොහෝ දේ සිදුවූ බව කිව යුතුයි. දූෂිත මැතිවරණ තුළින් ප්‍රතිඵලය වෙනස් වූ අවස්ථා වලදී වුවද නීතිය මගින් එය නිවැරදි කරගැනීමට නොලැබුණා බොහෝ අවස්ථා ගැන කතා කිරීමත් තිශ්චලයි. මෙම මැතිවරණ දූෂණ හා මැර බලය යෙදවීම අවම කර ගැනීමට වැඩ පිළිවෙලක් අප පසුගිය මැතිවරණයේදී අම්පාර දිස්ත්‍රික්කයේදී හඳුන් දෙනු ලැබුවා පමණක් නෙවෙයි එයින් සාර්ථක ප්‍රතිඵලද නෙලා ගත්තා. "හස්ටි සේනා" නමින් හඳුන්වනු ලැබූ මේ වැඩ පිළිවෙල දිවයින පුරා ව්‍යාප්ත කර ඊළඟ මැතිවරණ වලට කලින් ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. මෙමගින් සිදුවන්නේ අලුත් සාමාජිකයන් ගමකින් අවම වශයෙන් 25 දෙනකුවත් බඳවා ගන්නා අතර සෑම ජන්ද මධ්‍යස්ථානයක්ම ආවරණය වන පරිදි පනස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ඇති කිරීමයි. මෙම කණ්ඩායම මගින් පැවැත්වූ මැතිවරණ රාශියකදී ජන්දය නොදුන් ඉතා විශාල එක්සත් ජාතික පක්ෂ ජන්ද දායකයින් ප්‍රතිශතයක් ජන්දය දැමීමට උණන්දු කර ජන්දය දැමීමට සැළැස්සුවා. එමගින් ලක්ෂ ගණනක අලුත් සාමාජිකයන් හා ජන්ද එක්සත් ජාතික පක්ෂය වෙත යොමු කර ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා.

රටේ ජනතාව දැඩි ආර්ථික අමාරුවකට පත්ව තිබෙන බව පෙනී යනවා. ඒ නිසා රටේ ජනතාව පක්ෂය වටා රොක් කර ගැනීමේ ව්‍යාපාරයක් අප දැන් කරගෙන යනවා. එක්සත් ජාතික පක්ෂ රජයක් යටතේ අප රටේ මානව සම්පත උපයෝගී කරගෙන නිෂ්පාදනය වැඩි කිරීමෙන් රට සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් අපි ඇති කරනවා. එමගින් රටේ ආර්ථිකය ගොඩ නැගීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම සඳහන් කරන්නට කැමතියි අප රටට ආදායය කරන විශාල පිරිසක් රටින් බැහැරව ජීවත් වන නිසා ඒ අයගෙන් ඉල්ලා සිටිනවා එක්සත් ජාතික පක්ෂයට සහයෝගය ලබා දෙන ලෙස. රටේ අනාගත පරම්පරාවට හොඳ රටක් නැවත ඇති කිරීම සඳහා අපත් සමග අත්වැල් බැඳගන්නා ලෙසත් ඕස්ට්‍රේලියාවේ වෙසෙන සිංහල ද්‍රවිඩ මුස්ලිම් ශ්‍රී ලාංකික ජනතාවගෙන් ඉල්ලා සිටින්න කැමතියි.

සංවර්ධන ව්‍යාපෘති ලෙස ඔබ නොදකින්නේ ඇයි?

එදා 1977 එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණි අවස්ථාවේ වසර 30 කින් නිම කිරීමට තිබූ මහවැලි ව්‍යාපෘතිය පස් වසරකින් නිම කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපේ රට සහලින් ස්වයංපෝෂිතයි. ඈත ගම් දනව් කරා විදුලිය ගෙන ගියා. ඉඩම් නැති ලක්ෂ ගණනකට ඉඩම් ලබා දුන්නා. ඕයගම කටුනායක වැනි නිදහස් වලෙද කලාප මගින් ලක්ෂ ගණනකට රැකියා අවස්ථා ලබා දුන්නා. එම ව්‍යාපෘති සඳහා ලබාගත් ආධාර වලට අමතරව ඒ සඳහා ලබා ගත් ණය අප රජය කාලයේදීම ගෙවීමට හැකියාව ලැබුණා. ඊට හේතුව එම ව්‍යාපෘති මගින් විදේශ විනිමය ගලා ඒමයි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ විදේශ විනිමයෙන් 53% ක් අදහලුම් කර්මාන්තයෙන් රටට ගලා ආවා. අද එම ව්‍යාපාර පවත්වාගැනීමට නොහැකි තත්වයක් උදා වී තිබෙන්නේ රජය පටවා ඇති අධික බදු බර නිසා සහ අවශ්‍ය ඇතුවුම් නොලැබීම නිසාත්.

ඒ වගේම එදා සංවර්ධන ව්‍යාපෘති මගින් රැකියා හා ප්‍රතිලාභ අවස්ථා ලැබුණේ රටේ ජනතාවටයි. අද තිබෙන සංවර්ධන ව්‍යාපෘති මගින් රැකියා අවස්ථා ලැබෙන්නේ චීන හා ඉන්දියානු ශ්‍රමිකයන-'ටයි. අපේ රටේ තරුණ තරුණියන්ගේ විරැකියාව නිසා ඔවුන්ට ඉතා අඩු වේතන වලට විදේශ ගතවීමට සිදුවී තිබෙනවා. විශේෂයෙන් ලක්ෂ ගණනින් පවුල් ජීවිත කඩා ඉිගිරෙමින් මැද පෙරදිග යන ගෘහ සේවිකාවන් එවන විදේශ විනිමයෙන් අපේ රටේ මැති ඇමතිවරු සුර සැප විඳින බව අවධාරණයෙන් කිය යුතුයි. එදා අපේ රජයෙන් කරන ලද ව්‍යාපෘති වලින් රටට මහා සෙතක් වුවද අද සංවර්ධන ව්‍යාපෘති වලින් රටට බරක් වන (නොරෝච්චෝලේ හම්බන්තොට වරාය වැනි) සුදු අලි බවට පත් වී තිබුණ ද මිලියන ගණනින් කොමිස් උපයන බලවතුන් සුළු කොටසකට පමණක් සෙතක් සැලසෙනවා. හම්බන්තොට වරායට මිලියන 1600 ක් වියදම් කළ ද රටට එයින් පිච්චියක් වත් ලැබෙන්නේ නැහැ. එපමණක් නෙවෙයි පෙර අධ්‍යනයකින් තොරව එය නිම කරන ලද නිසා තවත් මිලියන 380ක් එහි පතුලේ ඇති ගල කැඩීමට වියදම් කළ යුතයි. චීණ ශ්‍රම බලය යොදා නිම කළ ඒ වරායේ සියළු ණය බර අපේ රටේ ජනතාවට දැරීමට සිදුවී ඇත . නොරොච්චෝලේ හා හම්බන්තොට ගුවන් තොටුපොල ගැන ද කිව යුත්තේ මෙය මය. අද පවතින්නේ සංවර්ධනයක් නොව සංවර්ධන සංදර්ශනයකි.

පසුගියදා පැවැත්වූ නැගෙනහිර හා උතුරුමැද පළාත් සභා ජන්දයෙන් ඔබ පක්ෂය නැවතත් පරාජයට පත් කරනු ලැබුවා. එහිදී තරග කළ අපේක්ෂකයකු වශයෙන් ඔබට කිව හැක්කේ කුමක්ද?

2009 නැගෙනහිර පළාත් සභා ජන්දයෙන් රජය වැඩි ජන්ද ලක්ෂයකට වැඩියෙන් ජයග්‍රහණය කළ බව ඔබ දන්නවා. ඒ සඳහා රාජ්‍ය බලය රාජ්‍ය සම්පත් මැරබලය පමණක් නොව රටේ සියළුම ජනමාධ්‍ය ඔවුන් යොදා ගත්තා. මෙවරත් ඒ ආකාරයෙන්ම අවශ්‍ය සෑම බලයක්ම පාවිච්චි කළ ද එක්සත් ජාතික පක්ෂය ද්‍රවිඩ සංධානය හා මුස්ලිම් කොන්ග්‍රසය වැඩි ජන්ද ලක්ෂ දෙකක් රජයට විරුද්ධව ලබාගෙන තිබෙනවා. එයින් පෙනී යන්නේ නැගෙනහිර බහුතර ජනතාව රජය ප්‍රතික්ෂෙප කර තිබෙන බවයි. මහමැතිවරණයකදී හෝ ජනාධිපතිවරණයකදී හෝ මෙම ප්‍රතිඵලය මිටත් වඩා වෙනස් විය හැකියි.